ගලිගමුව ප්‍රාදේශීය සභාව.
කෑගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 අගෝස්තු 25 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ගලිගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ප්‍රමිතියේ 21(ඇ) වගන්තිය අනුව හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබූ අතර 21(ඉ) වගන්තිය අනුව අදාල ආයතනයේ අයවැයගත දත්ත සමඟ සත්‍ය දත්ත මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කලයුතු වුවත්, එසේ ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ඉකුත් වර්ෂය සඳහා වූ මුද්දර ගාස්තු සකස් කිරීම වෙනුවෙන් ගෙවන ලද රු. 54,125 ක ඉඩම් රෙජිස්ටාර් කාර්යාලීය නිලධාරීන්ගේ දිරි දීමනා, සමාලෝචිත වර්ෂයේ ආදායමට ගැලපීම නිසා අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෝටර් රථ හා කරත්ත ගිණුමේ රු. 8,602,682 ක ශේෂයෙහි සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ට අයත් රු. 1,090,000 ක ට්‍රැක්ටරයක් හා රු. 260,000 ක ටේලරයක් ඇතුලත් වීම හේතුවෙන් වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) රු. 7,740,000 ක් වටිනා කැබ් රථයක් සමාලෝචිත වර්ෂය තුලදී ණය පදනම මත මූලිකව රු. 4,700,000 ක් ගෙවා මිලට ගෙන තිබුණි. ඒ සඳහා ණය වාරික හා පොලියද සමඟ එකතුව රු. 4,858,962 ක් වර්ෂයේ ගිණුම් වල ප්‍රාග්ධනිත කර තිබූ අතර එම වටිනාකම මත වාර්ෂික ක්ෂය ප්‍රතිපාදන වශයෙන් රු. 485,896 ක්ද ගිණුම්ගත කර තිබුණි. එසේ වුවද, කැබ් රථයේ සත්‍ය වෙළඳපල අගය වූ රු. 7,740,000 ක වටිනාකමද, තවදුරටත් ගෙවිය යුතුව තිබූ (රු. 9,111,020 - රු. 4,858,962) රු. 4,252,058 ක ණය හා පොලී වටිනාකමද ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් ලේඛණයේ ඉඩම් හා ගොඩනැගිලි යටතේ දැක්වෙන සුසාන භූමි 18 ක්ද, ඉඩම් 06 ක්ද, ප්‍රජා ශාලා 02 ක්ද මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඉ) ස්ථාවර වත්කම් ලේඛණය අනුව රු. 66,000 ක් වටිනා යතුරු පැදියක්ද, රු. 1,685,602 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ අයිතම 07 ක්ද මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

1.3.3 අසම්භාව්‍ය බැරකම්

සභාවේ වත්කම් හා වගකීම් වලට අදාල නීතිමය හා වෙනත් බැඳීම් සම්බන්ධයෙන් පවතින අසම්භාව්‍ය බැරකම් වටිනාකම ගණනයකර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

1.3.4 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 19 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 15,474,487 වූ අතර, උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 14,350,739 ක් වූයෙන් වෙනස රු. 1,123,748 ක් විය.

1.3.5 ගෙවිය යුතු ගිණුම්

2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 704,444 ක් විය.

1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මු.රෙ. 371 (2) (ඇ) | අවස්ථා 14 කදී ගෙවන ලද තත්කාර්ය අත්තිකාරම් රු. 337,220 ක මුදලක් නිරවුල් කර නොතිබුණි. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| | 132 (ඒ) වගන්තිය | ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතියකින් තොරව අවස්ථා 6 කදී එකතුව රු. 250,000 ක් වූ වියදම් දරා තිබුණි. |

02. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,675,551 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 4,556,882 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 2,881,331 ක පිරිහීමක් පෙන්නුම් කෙරේ.

2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ පුනරාවර්ථන වියදම් රු. 2,824,772 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | තථ්‍ය | දෙසැම්බර්31දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) වරිපනම් හා බදු | 2,325 | 2,175 | 150 |
| (ii) බදු කුලී | 413 | 413 | - |
| (iii) බලපත්‍ර ගාස්තු | 740 | 640 | 100 |
| (iv) වෙනත් ආදායම් | 9,825 | 12,148 | - |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 131,000 ක් හා මුද්දර ගාස්තු රු .6,200,479 ක් විය.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු. 4,987,415 ක් විය.

3.2 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

සභාවට අයත් බැංකු ගිණුමක රු. 46,582 ක ශේෂයක් අක්‍රියව පැවතුණි.

04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

05. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය